## 1. පක්ෂයේ නාමය

- අඩහැර ගොවි හවුල, සත්පවුර, විශ්ව ධර්ම යන නම්වලින් මීට පෙර "ගුඩ් හර්ට්ස්" පදනම ඔස්සේ පෙරට ආ අභිනව නිවහල් පෙරමුන යන නාමයෙන් වෙනම පක්ෂයක් විය යුතු බවට තීරණය විය. එසේ නම් වන ලද්දේ පුද්ගලයා, නිවස, අසල්වැසියා, ගම, පෙදෙස, දිස්ත්‍රික්කය හෙවත් දිසාව, රට යන සත්පවුරම වෙන වෙනම වැළඳගෙන එකට යා කෙරෙන සංස්කරණයමය වැඩපිළිවෙලක් මෙම පක්ෂයෙන් ක්‍රියාත්මක වන නිසාය. ස්වතන්ත්‍රවාදී යන වචනය වෙනුවෙන් ස්වාධිපති යන වරිතය දෙවනුව ආදේශ විය.

## 2. ලාංඡනය

- දේශපාලන පක්ෂයක් වසශයෙන් ඉල්ලුම්කර ලබාගත් මුදල් කැටය පක්ෂයේ ලාංඡනයයි.

## 3. ආදර්ශ පාඨය

- කරන හැම කටයුතු - කෙසේ හෝ නොව
  කළයුතු දේ දැහැමින්ම ඉටුවිය යුතු බව සිත්හි තබා ගත යුතුය.

## 4. ධජය

- බහු වර්ණ පසුබිමක පක්ෂයේ නම හා ලාංඡනය සහිත ධජය

## 5. කාර්යයාලය

- පක්ෂයේ ප්‍රධාන කාර්යයාලය නො. 3/1, සංඝමිත්තා මාවත, මහනුවර යන ස්ථානයේ දැනට පවත්වාගෙන යා යුතුය. තැපැල් ලිපිනය ලෙස නො.963/B ගනේමුල්ල පාර, මා-එළිය, ජා-ඇල යන ලිපිනය භාවිතා කල යුතුය.

## 6. පරමාර්ථ විග්‍රහය

- මිනිස්කම පිරිහීමට තුඩුදෙන බලකාමය තුරන් කිරීම් වස් මහජන නියෝජිතයින් තෝරාගැනීමේ නව ක්‍රමයක් රටට හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම.

